ශ්‍රී ලංකා දුම්රිය සේවය
SRI LANKA RAILWAYS
இலங்கை புகையிரத சேவைகள்

# "දිට්වා" සුළි කුණාටුවෙන් හානියට පත් උතුරු දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු 2026/04/09 දින සිට යාපනය/කන්කසන්තුරය දක්වා නැවත දුම්රිය ධාවනය ආරම්භ කිරීම.

"දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් උතුරු දුම්රිය මාර්ගයේ ස්ථාන 14 ක් බරපතල ලෙස හානි සිදුවී තිබුණි. මෙම ස්ථාන තාවකාලික පිළිසකර කිරීම් වලින් පසු දුම්රිය ධාවනය 2025/12/24 දින සිට ආරම්භ කල අතර එහිදී කොළඹ කොටුව /යාපනය අතර දුම්රිය ධාවනය අඩු වේගයකින් සිදුවිය. "දිට්වා" සුළි කුණාටුවෙන් හානි වූ එම ස්ථාන 14 හි ස්ථිර ප්‍රතිසංස්කරණය කටයුතු සඳහා නැවතත් 2026/01/19 දින සිට උතුරු මාර්ගයේ ධාවනය තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරන ලද අතර මෙම ප්‍රතිසංස්කරණ කටයුතු ඉන්දියානු රජයේ ප්‍රදානයක් මත ලැබුණු ඩොලර් මිලියන 05ක මුදලකින් සිදු කරන ලදී.

"දිට්වා" සුළි කුණාටුවෙන් හානි වූ ස්ථාන 14 ප්‍රතිසංස්කරණයෙන් පසු හා මහව - ඕමන්තේ මාර්ග නවීකරණයට අදාළව ස්ථානගත කල යුතුව තිබූ පාලම් 05 ක් සහ "කාසිකොටේ" අලි උමගේ කටයුතු යන සියළුම කටයුතු අවසන් වීමෙන් පසු 2026/04/09 වන දින සිට පහත ආකාරයට උතුරු මාර්ගයේ දුම්රිය ධාවනය ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. යාපනය නගරාන්තර දුම්රිය සහ යාපනය රාත්‍රී තැපැල් දුම්රිය 2026/04/09 දින සිටත්, යාල් දේවි දුම්රිය 2026/04/10 වන දින සිටත් දිනපතා ධාවනයට සැලසුම් කර ඇත. එම දුම්රියන් නවත්වනු ලබන ප්‍රධාන දුම්රිය ස්ථාන කිහිපයක පිටත්වීමේ වේලාවන් පහත පරිදි වේ.

## [1] යාපනය නගරාන්තර දුම්රිය

| | ගල්කිස්ස - කන්කසන්තුරය<br>கல்கிசை – காங்கேசன்துறை | | කන්කසන්තුරය - ගල්කිස්ස<br>காங்கேசன்துறை – கல்கிசை | |
|---|---|---|---|---|
| | දුම්රිය ස්ථානය<br>புகையிரத நிலையம் | පිටත්වන වෙලාව<br>புறப்படும் நேரம் | දුම්රිය ස්ථානය<br>புகையிரத நிலையம் | පිටත්වන වෙලාව<br>புறப்படும் நேரம் |
| 1 | ගල්කිස්ස<br>கல்கிசை | 05.15 a.m. | කන්කසන්තුරය<br>காங்கேசன்துறை | 01.50 p.m. |
| 2 | කොළඹ කොටුව<br>கொழும்பு கோட்டை | 05.45 a.m. | යාපනය<br>யாழ்ப்பாணம் | 02.15 p.m. |
| 3 | අනුරාධපුරය<br>அனுராதபுரம் | 09.25 a.m. | වව්නියාව<br>வவுனியா | 04.05 p.m. |
| 4 | වව්නියාව<br>வவுனியா | 10.04 a.m. | අනුරාධපුරය<br>அனுராதபுரம் | 05.00 p.m. |
| 5 | යාපනය<br>யாழ்ப்பாணம் | 11.56 a.m. | කොළඹ කොටුව<br>கொழும்பு கோட்டை | 08.34 p.m. |
| 6 | කන්කසන්තුරය<br>காங்கேசன்துறை | 12.14 p.m. | ගල්කිස්ස<br>கல்கிசை | 09.15 p.m. |

## [2] යාල් දේවී දුම්රිය

| | කොළඹ කොටුව - කන්කසන්තුරය<br>கொழும்பு கோட்டை – காங்கேசன்துறை | | කන්කසන්තුරය - කොළඹ කොටුව<br>காங்கேசன்துறை – கொழும்பு கோட்டை | |
|---|---|---|---|---|
| | දුම්රිය ස්ථානය<br>புகையிரத நிலையம் | පිටත්වන වෙලාව<br>புறப்படும் நேரம் | දුම්රිය ස්ථානය<br>புகையிரத நிலையம் | පිටත්වන වෙලාව<br>புறப்படும் நேரம் |
| 1 | කොළඹ කොටුව<br>கொழும்பு கோட்டை | 06.40 a.m. | කන්කසන්තුරය<br>காங்கேசன்துறை | 10.30 a.m. |
| 2 | අනුරාධපුරය<br>அனுராதபுரம் | 10.51 a.m. | යාපනය<br>யாழ்ப்பாணம் | 11.00 a.m. |
| 3 | වව්නියාව<br>வவுனியா | 11.39 a.m. | වව්නියාව<br>வவுனியா | 01.36 p.m. |
| 4 | යාපනය<br>யாழ்ப்பாணம் | 02.10 p.m. | අනුරාධපුරය<br>அனுராதபுரம் | 02.40 p.m. |
| 5 | කන්කසන්තුරය<br>காங்கேசன்துறை | 02.33 p.m. | කොළඹ කොටුව<br>கொழும்பு கோட்டை | 07.03 p.m. |

## [3] යාපනය රාත්‍රී තැපැල් දුම්රිය

| | මොරටුව - කන්කසන්තුරය<br>மொறட்டுவ – காங்கேசன்துறை | | කන්කසන්තුරය - මොරටුව<br>காங்கேசன்துறை –மொறட்டுவ | |
|---|---|---|---|---|
| | දුම්රිය ස්ථානය<br>புகையிரத நிலையம் | පිටත්වන වෙලාව<br>புறப்படும் நேரம் | දුම්රිය ස්ථානය<br>புகையிரத நிலையம் | පිටත්වන වෙලාව<br>புறப்படும் நேரம் |
| 1 | මොරටුව<br>மொறட்டுவ | 06.55 p.m. | කන්කසන්තුරය<br>காங்கேசன்துறை | 08.00 p.m. |
| 2 | කොළඹ කොටුව<br>கொழும்பு கோட்டை | 08.00 p.m. | යාපනය<br>யாழ்ப்பாணம் | 08.35 p.m. |
| 3 | අනුරාධපුරය<br>அனுராதபுரம் | 00.05 a.m. | වව්නියාව<br>வவுனியா | 11.15 p.m. |
| 4 | වව්නියාව<br>வவுனியா | 01.09 a.m. | අනුරාධපුරය<br>அனுராதபுரம் | 00.09 a.m. |
| 5 | යාපනය<br>யாழ்ப்பாணம் | 03.55 a.m. | කොළඹ කොටුව<br>கொழும்பு கோட்டை | 04.45 a.m. |
| 6 | කන්කසන්තුරය<br>காங்கேசன்துறை | 04.24 a.m. | මොරටුව<br>மொறட்டுவ | 05.25 a.m. |

යාපනය නගරාන්තර දුම්රියේ ආසන වෙන්කිරීමේ පහසුකම සහිත වායු සමනය කල පළමු පංතියේ මැදිරි 09 කින් යුතු අතර යාල් දේවී දුම්රියේ වායු සමනය කල පළමු පංතියේ මැදිරි 02 කින් සහ රාත්‍රී තැපැල් දුම්රියේ වායු සමනය කල පළමු පංතියේ මැදිරි 04 ක් ද දෙවන පංතියේ වෙන්කළ ආසන සහිත මැදිරි දෙකකින්ද යුක්ත වේ. https://seatreservation.railway.gov.lk යන සබැඳිය ඔස්සේ ද ආසන වෙන්කිරීමේ පහසුකම සලසා ඇති දුම්රිය ස්ථානයකට පැමිණීමෙන්ද මෙම දුම්රියන් වල ආසන වෙන්කරවා ගැනීමට පහසුකම් සලසා ඇත.

G.D.A සමරසිංහ
අධිකාරී (ගමනාගමන)
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට